# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
# බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

## විශේෂ දැන්වීමයි

### 1. විභාග අයදුම්පත් කැඳවා ඇති පාඨමාලා

1. වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි II පරීක්ෂණය
2. 2014/2015/2017 විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධි II/ III පරීක්ෂණය
3. ශාස්ත්‍රවේදී මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා (සාමාන්‍ය) බාහිර උපාධි II පරීක්ෂණය
4. 2019 සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි I පරීක්ෂණය
5. 2011/2014/2016 සහ 2017 විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි II පරීක්ෂණය
6. 2019 ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධි I පරීක්ෂණය

- ඉහත පරීක්ෂණ වලට අදාළව මුදල් ගෙවා, රිසිට්පත් ලබා ගත නොහැකි සහ අයදුම්පත් තැපැල් කිරීමට නොහැකි දිවයිනේ දැනට හුදෙකලා කර ඇති ප්‍රදේශ වල සිටින සිසුන් බැංකු කටයුතු සහ තැපැල් කටයුතු යථා තත්ත්වට පත් වූ විගස මුදල් ගෙවා, විභාග අයදුම්පත් බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට ලියාපදිංචි තැපැලෙන් එවීමට කටයුතු කළ යුතුය.

### 2. පරීක්ෂණ පැවැත්වීම

1. විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි I පුනර් පරීක්ෂණය (2011, 2014, 2016, 2017 ශිෂ්‍ය කණ්ඩායම්)
2. විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධි III පරීක්ෂණය (2016 ශිෂ්‍ය කණ්ඩායම)

2020 නොවැම්බර් මස පැවැත්වීමට නියමිතව තිබූ උක්ත පරීක්ෂණ රටේ පවතින අයහපත් සෞඛ්‍ය තත්ත්වය හේතුවෙන් නැවත දැනුම් දෙන තෙක් තාවකාලිකව කල් දමා ඇත. එම පරීක්ෂණ නැවත පැවැත්වෙන දින පසුව දැනුම් දෙනු ලැබේ.

### 3. 15 වන බාහිර උපාධි ප්‍රදානෝත්සවය පැවැත්වීම

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මගින් 2020 නොවැම්බර් 16 වන දින පැවැත්වීමට නියමිතව තිබූ 15 වන බාහිර උපාධි ප්‍රදානෝත්සවය රටේ පවතින අයහපත් සෞඛ්‍ය තත්ත්වය මත එදින නොපැවැත්වෙන අතර නැවත පැවැත්විය හැකි දිනය පසුව දැනුම් දෙනු ලැබේ. තවද එම උපාධිලාභීන්ගේ විස්තරාත්මක ශ්‍රේණි සහතික පත්‍ර පමණක් 2020.11.17 වන දින සිට තැපැල් මගින් යොමු කිරීමට බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මගින් කටයුතු කරනු ලැබේ. ඔවුන්ට අදාළ උපාධි සහතිකපත්‍ර උපාධි ප්‍රදානෝත්සවය පැවැත්වෙන දින නිකුත් කරනු ලැබේ.

අධ්‍යක්ෂ
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය